www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරානයට එරෙහි එක්සත් ජනපද තර්ජන - න්‍යෂ්ටික ම්ලේච්ඡත්වයේ අවතාරය

**US threats against Iran—the specter of nuclear barbarism**

**ලෝසවෙඅ කර්තෘ මන්ඩල ප්‍රකාශය**

**2006 අප්‍රේල් 13**

එක්සත් ජනපද ආන්ඩුව ඉරානයට එරෙහිව න්‍යෂ්ටික අවි යොදා ගැනීමේ ශක්‍යතාව ද සහිත බෝම්බ ප්‍රහාර එල්ල කිරීමේ ක්‍රියාවලියක් සඳහා පෙර සැලසුම් ද සහිතව සූදානම්ව සිටින්නේ ය යන කාරනය හෙලිදරව්වීම එන්ට එන්ටම ඉහල යන අස්ථාවර ජාත්‍යන්තර තත්වයක් තුල බැරෑරුම් ම තර්ජනය මතු කර තිබේ.

වලක්වාලූයේ නැතිනම් සංසන්දනයේ දී දෙවන ලෝක යුද්ධය මැකී යන තරමේ, ඉමහත් ඓතිහාසික ව්‍යසනයකට ලෝකය ඇද දැමීමේ ගමන් මාවතකට එක්සත් ජනපද අධිරාජ්‍යවාදය එලඹ සිටියි.

බුෂ්ගේ ධවල මන්දිරය විසින් මෙවන් කටයුත්තකට සිත් යොමු කලේය යන්න පවා ලෝකයේ ඉරනම හා මිනිස් වර්ගයාගේ අනාගතය පිලිබඳව සැලකිලිමත්වන සියල්ලන් තැතිගැන්මට හා භ්‍රාන්තියට පත් කරනු ඇත. ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් හිරෝෂිමාවට සහ නාගසාකියට එරෙහිව ප්‍රථම න්‍යෂ්ටික බෝම්බ හෙලීමෙන් -- එතැන් සිට සියලු පරම්පරාවන් මෙවැන්නක් කිසිදිනක යලි සිදුවිය නොයුතු යයි දිව්රීමට තරම් බිහිසුනු තත්වයක් ඇති කල -- දශක හයකට මඳ කලකට පසුව වොෂිංටනය එවන් බිහිසුනු අවි යොදා ගැනීම පිලිබඳව සක්‍රීය ලෙස සලකා බලමින් සිටියි. මේ වතාවේ දී එය සිදුවන්නේ කුපිත කිරීමකින් හෝ අනාගත තර්ජනයක් ගැන පිලිගතහැකි හේතු සාධකවලින් පවා තොරව ය. එවන් ක්‍රියාවකින් ඇමරිකාව රටක් හා සමාජයක් ලෙස සාපරාධීකරනයට තුඩු දෙනු ඇත.

මෙම සැලසුම් සැබෑවනවා පමනක් නොව, මේ සතියේ නිව් යෝකර් සඟරාවේ ලිපියක සේමෝ හර්ෂ් විසින් මෙන්ම වොෂිංටන් පෝස්ට් පුවත්පත විසින් ද ස්ථිර කර තිබූ අයුරු ක්‍රියාවට නංවමින් ද තිබේ. ඉලක්කයන් හඳුනා ගැනීම සඳහා විශේෂ මෙහෙයුම් භටකායන් ඉරානය තුල ස්ථානගත කිරීම සහ ඉරාන න්‍යෂ්ටික බලාගාරවලට එරෙහිව න්‍යෂ්ටික තුඩකින් යුත් මිසයිල එල්ල කිරීමට අනුරූපිත ගුවන් අභ්‍යාසය අරාබි මුහුදට ඉහල අහසේ පැවැත්වීම ද සූදානම්වීමට ඇතුලත් වෙයි.

මෙම ලිපි පල කල තැන් පටන් තමන්ගේ න්‍යෂ්ටික බල සැලසුම සඳහා අවශ්‍ය යුරේනියම් පෝෂනය කිරීමේ දී තමන් සාර්ථක වූ බව ඉරාන ආන්ඩුව අගහරුවාදා නිවේදනය කිරීම සමග, යුද තර්ජනය උත්සන්න විය. යලි වරක් ටෙහෙරානය, මෙම ක්‍රියා මාර්ගය හුදෙක් ම සාමකාමී කටයුතු සඳහා පමනක් බව අවධාරනය කල අතර ඉරානය තවමත් සිටින්නේ න්‍යෂ්ටික අවියක් සඳහා අවශ්‍ය වන ආයුධ ශ්‍රේනියේ පෝෂනය කල යුරේනියම් නිපදවීමේ හැකියාවට බොහෝ පිටුපසින් බව මෙම වර්ධනයෙන් පසුව විශේෂඥයෝ සහතික වෙති.

ටෙහෙරානයේ ආන්ඩුව විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගයන් තුල නිසැකව ම නොසැලකිලිමත් භාවයේ ප්‍රබල මූලයක් පවතී. ඉරානය ඇතුලත පවතින දේශපාලන හා සමාජ ආතතීන් වෙනතකට හැරවීමේ මාධ්‍යයන් ලෙස, එක්සත් ජනපදයේ තෙරපීම කෙරෙහි ඉරාන මහ ජනතාවගේ බහුතරයක් දක්වන ජාතිකවාදී නොසතුට උපයෝගී කර ගන්නා ආන්ඩුව, න්‍යෂ්ටික ගැටුම තුල තමන්ගේ ම අදූරදර්ශී දේශපාලන අරමුනු ඔස්සේ ගමන් කරමින් සිටිති.

ඉරාන ආන්ඩුව පාලනය කරන ධනේශ්වර කන්ඩායම්වල ක්‍රියාවන්ගෙන්, යුද්ධයේ තර්ජනයෙන් ඉරාන ජනතාව ආරක්ෂා කිරීමට කිසිදු පිටුබලයක් නොසැපයෙයි. සැබවින්ම ඔවුන්, ධවල මන්දිරය පාලනය කරන දක්ෂිනාංශික මිලිටරිවාදී කල්ලියේ ගැටයට අසු වී තිබේ.

යුද්ධය සඳහා එක්සත් ජනපදයේ නව සූදානම තුල, දේශීය දේශපාලන ගනන් බැලීම්, මූලික ක්‍රියා කලාපයක් ඉටු කරයි. බුෂ්ගේ පිලිවෙත් සඳහා වන ජනතා සහාය බිඳවැටීම -- එය මත් එක්සත් ජනපදය තුල තදින් මුල් බැසගත් සමාජ අර්බුදයේ ප්‍රකාශනයකි -- මහජන මතය පාගා දැමීමටත් විරුද්ධවාදීන් මර්දනයටත් මාවතක් ලෙස මිලිටරි ආක්‍රමනකාරිත්වයේ තවත් ක්‍රියා මාලාවක් දියත් කිරීමට පරිපාලනය දිරිමත් කර තිබේ.

සිතාගත හැකිව තිබූ පරිදි ම බුෂ් පරිපාලනය සිය යුදවාදී තර්ජන නොකඩවා එල්ල කරමින් ටෙහෙරානයේ අලුත්ම නිවේදනයට ප්‍රතිචාර දක්වී ය. රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් බදාදා කියා සිටියේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය "ජාත්‍යන්තර ප්‍රජාවගේ කීර්තිය පවත්වාගැනීම" සඳහා ඉරානයට එරෙහිව "දැඩි පියවර" ගත යුතු බව යි. ඇය මෙසේ ද කීවා යඃ "අපට මෙය දිගින් දිගටම පැවතීමට ඉඩ දිය නොහැක".

ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් ඉරානය "ත්‍රස්තවාදීන්ට සහාය දෙන ... රටක් ලෙස විස්තර කලේ ය. "එය ජන සංහාරක අවි අත්පත් කර ගැනීමේ අවශ්‍යතාවයෙන් පෙලෙන රටකි", යනුවෙන් ද ඔහු කියා සිටියේ ය.

ඉරාකයට එරෙහිව යුද්ධයට යෑමේ දී යොදා ගත් පරිද්දෙන් ම, එක්සත් ජනපදය මූලිකත්වය ගන්නා " පාලන තන්ත්‍ර වෙනසකින්" පමනක් නවතාලිය හැකි " ජන සංහාරක අවිවල" සංකල්පිත ආසන්න තර්ජනයන් පිලිබඳ දුෂ්ට හා තහවුරු නොකල අනතුරු ඇඟවීම්වලට සමානවූ කෙටුම්පතක් පරිපාලනය විසින් අනුගමනය කරයි. යලිත් වතාවක් වොෂිංටනය ඉරාන න්‍යෂ්ටික වැඩ පිලිවෙල පිලිබඳව එක්සත් ජාතීන්ගේ නිරීක්ෂනයන් වැදගැම්මකට නැතැයි ඉවත දමන අතර රුසියාවේ, චීනයේ සහ සමහර විට ආරක්ෂක මන්ඩලයේ අනෙකුත් සාමාජිකයන් ද මිලිටරි ප්‍රහාරයක් ප්‍රතික්ෂේප කිරීමේ නිශ්චිත තතු තුල බුෂ්ගේ ධවල මන්දිරය යලිත් වරක් එක්සත් ජාතීන්ගේ මන්ඩලය අදාලත්වයක් නැතැයි ප්‍රකාශ කරමින් තමන්ගේම ඒක පාර්ශ්වික ක්‍රියාවන්ට එලඹීම පිලිබඳව තිබිය හැක්කේ සුලු සැකයකි.

උසස් ජාත්‍යන්තර අධ්‍යයනයන් පිලිබඳව ජෝන් හෝකින්ස් විශ්වවිද්‍යාල පාසලේ ප්‍රේක්ෂකයන් ඉදිරියේ කතා කරමින් උතුරු කොරියාවේ සහ දැන් ඇමරිකාවේ ග්‍රහනයෙහි පසුවන ඉරාකය සමග ඉරානය ද "පාපීන්ගේ අක්ෂයේ" ම කොටසක් වන්නේ යයි 2002 දී ඔහු කල යුදවාදී හෙලා දැකීම බුෂ් යලි ප්‍රකාශයට පත් කලේ ය.

ඉරානය සම්බන්ධව තම මූලෝපාය "වලක්වාලීමේ ධර්මතාවය" මත පදනම්ව තිබෙන බව බුෂ් ප්‍රකාශ කලේ ය. ජාත්‍යන්තර රාෂ්ට්‍ර පාලනයේ භාෂාවෙන්, වලක්වාලීමේ යුද්ධයක් යනු තමන් හඳුනාගත් විරුද්ධවාදියකු බලය ලබාගැනීමෙන් හෝ අනාගතයේ දී මූලෝපායික වාසියක් අත් කර ගැනීමෙන් හෝ වලක්වාලීම අරමුනු කරගෙන දියත් කරනු ලබන ආක්‍රමන කාරිත්වයේ යුද්ධයකි. ජර්මන් නාසි පාලකයන්ට එරෙහිව නියුරම්බර්ග් නඩු විභාගවල දී තහවුරු කරන ලද පූර්වාදර්ශයන්ට අනුව මෙය යුද අපරාධයකි.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය එක්සත් ජනපද පරිපාලනය අනුගමනය කරන ප්‍රතිපත්ති සහ 1930 ගනන් සහ 1940 ගනන්වල ජර්මානු තුන්වන රීකයේ නායකයින් යොදා ගත් විධික්‍රම අතර පවතින නග්න සමාන්තරය පිලිබඳව අවධානය යොමු කරවා තිබේ. ජාත්‍යන්තර නීතිය පිලිබඳ දැඩි සතුරුකම ව්‍යාජ නිමිති මත පදනම්ව මිලිටරි ආක්‍රමන දියත් කිරීම, සාපේක්ෂව දුබල ජාතීන්ට එරෙහිව දැවැන්ත ප්‍රහාරක බලයක් යෙදවීම මෙම තන්ත්‍රයන් දෙකටම පොදු ය. අපගේ සමහර පාඨකයන් එවැනි සාදෘෂ්‍යයක් අතිශයෝක්තීන් ලෙස බැහැර කලා විය හැක. ඉරානයට එරෙහිව එක්සත් ජනපද යුද සැලසුම් පිලිබඳ අලුත්ම එලිදරව්වීම් සම්බන්ධයෙන් එවන් උදාසීනත්වයක් තව දුරටත් පැවතිය නොයුතු ය.

න්‍යෂ්ටික අවි නිපදවීමට භාවිතා කල හැකි වන තාක්ෂනය ලබාගැනීමෙන් ඉරානය වැලැක්වීම යැයි සංකල්පිත අරමුන වෙනුවෙන් න්‍යෂ්ටික අවි භාවිතා කිරීමේ එක්සත් ජනපද තර්ජනය තුල දෙවන ලෝක යුද්ධයෙන් පසුව පෘථිවි ග්‍රහයා මත කොතැනකදී හෝ ප්‍රථම වතාවට - අපරීක්ෂාකාරීත්වය හා උමතු බවේ පවා බලවත් මූලයක් පවතී.

## තෙල් සඳහා දිවීම හා මූලෝපායික වාසිය

කෙසේ වෙතත් මෙම විද්‍යාමාන පිස්සුවට යටින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් අනුගමනය කරන නිශ්චිත පිලිවෙතක් තිබේ. ඉරාකයේ දී මෙන්ම ඉරානයට විරුද්ධ යුද තර්ජනය පිටුපස ඇති ප්‍රමුඛ අභිලාෂය ජන ඝාතක අවි නොව තෙල් ය. යථාර්ථයේ දී වොෂිංටනය, ඉරාන න්‍යෂ්ටික වැඩපිලිවෙල දැවැන්ත තර්ජනයක් ලෙස ගනන් නොගනී. ඉරාකයේ දී මෙන් ම ජන සංහාරක අවි අනෙකුත් අරමුනු ලඟා කර ගැනීමේ මිලිටරි ක්‍රියාවට බොරු හේතුවක් ලෙස සේවය කරයි.

අප න්‍යෂ්ටික අවි අත් කර ගැනීමේ ඉරාන ආන්ඩුවේ වෑයමට සහයෝගය නොදෙන්නේ ඒවා කිසිදු අයුරකින් ඉරානයේ හෝ කලාපයේ අනෙක් තැනක හෝ කම්කරු අරගලයන්ට පිටුබලයක් නොවන්නේ ය යන මූලධාර්මාත්මක ස්ථාවරයේ සිට ය. කෙසේ වෙතත්, ඉරානය න්‍යෂ්ටික අවියක් අත් පත් කර ගත්තද එක්සත් ජනපදය අත තිබෙන දැවැන්ත බලයට සමානුපාතිකව එහි කිසිදු විශාල මිලිටරි වැදගත්කමක් ඇත්තේ නැත.

කොහොම නමුත් ඉරානය රුසියාව, ඊස්රායලය, පකිස්ථානය, ඉන්දියාව වැනි න්‍යෂ්ටික අවි සතු රටවලින් වටවී තිබෙන අතර ඉන් සමහරෙක් මෙම අවි අත්කර ගත්තේ වොෂිංටනයේ විවෘත සහයෝගයෙනි. එක්සත් ජනපදයේ සහයෝගය ලද ෂාගේ ඒකාධිපතිත්වය පෙරලා දමනු නොලැබුවේ නම් චේනි සහ රම්ස්ෆෙල්ඩ්වැනි මිනිසුන්ගේ සෘජු සහයෝගය ඇතිව

ආරම්භ කල න්‍යෂ්ටික වැඩ පිලිවෙලින් නිසැකවම බොහෝ කලකට පෙර බෝම්බ නිපදවිය හැකිව තිබුනි.

ඇමරිකානු පරිපාලනය, පවතින තත්වය පිලිබඳව මහජනයාගේ නොදැනුවත්කම සහ තමන්ගේ ගැති මාධ්‍ය හුදෙක්, තමන් අනුගමනය කරන නිශ්චිත උවමනාවන් පිටුපසින් දුමාරයක් නිර්මානය කිරීම, යන කාරනා ගසා කනු ලබයි.  ඉරානය සතුව ලොව දෙවන විශාලතම ස්වාභාවික ගෑස් නිධි සහ සෞදි අරාබියේ තෙල් සිඳී යාමෙන් අනතුරුවත් දශක කීපයක් තෙල් නිපදවතැයි බලාපොරොත්තු වන සතරවන විශාල තෙල් නිධි ද පවතියි. තවද, පර්සියානු බොක්කේ සහ කලාපයේ මූලෝපායික බලශක්ති සම්පත් මත්තේ අනභියෝගී අධිකාරය පිහිටු වීමේ එක්සත් ජනපද වෑයමට හරස් කැපීමට තර්ජනය කරන ඉරානය, ඉරාකයේ ඇමරිකානු මැදිහත්වීමේ ප්‍රධාන වාසිය ඩැහැගන්නා ලෙස ඉස්මතුවීමේ දේශපාලන කාරනාවට ද, වොෂිංටනය මුහුන දී සිටියි.

එක්සත් ජනපද උවමනාවන්ට වඩාත් ප්‍රබල තර්ජනය ලෙස පෙනීයන්නේ රුසියාව, චීනය සහ යුරෝපය සමග ඉරානයේ වැඩෙන සබඳතා ය. ඉරානයට එරෙහි තමන්ගේ දශක ගනනාවක ආර්ථික සම්බාධක පිලිවෙත්වලින් මූලෝපායික වාසියක් නෙලා ගැනීමට තම ප්‍රධාන ආර්ථික විරුද්ධවාදීන්ට ඉඩ හැරීමට වොෂිංටනයට කිසිදු අදහසක් නැත. විශේෂයෙන් ම, ඉරානය හා රුසියාව අතර සබඳතා, මධ්‍යම ආසියාවේ පැරනි සෝවියට් සමූහාන්ඩුවල මෙතෙක් අත නොගැසූ දැවැන්ත තෙල් හා ගෑස් නිධි පාලනය සඳහා එක්සත් ජනපදයේ ප්‍රවිෂ්ඨයට අවහිරයක් සේ එය දකින ලදී.

අවසාන විග්‍රහයේ දී ඉරානයට විරුද්ධ ආක්‍රමනකාරී යුද්ධයක සහ න්‍යෂ්ටික අවියොදාගැනීමේ තර්ජනය ඇමරිකානු සහ ලෝක ධනවාදයේ ඓතිහාසික අර්බුදය සහ සමස්ත ධනපති ජාතික රාජ්‍ය පද්ධතිය තුල උත්සන්න වන අසමතුලිතතාවය ප්‍රකාශයට පත් කරයි. මෙම අසමතුලිත භාවය-සහ එහි අනර්ථකාරී නිමැවුම වන නව ලෝක යුද්ධයක අනතුර - සෝවියට් සංගමය බිඳ වැටීම සහ ලෝක ආර්ථිකය තුල එක්සත් ජනපද ධනවාදයේ තත්වය සාපේක්ෂව පහල යාම යන දෙකම හේතුවෙන් අවුල් කර දමා තිබේ.

ඇමරිකාවේ පාලක කතිපයාධිකාරය ඇතුලත මෙම සමාන්තර වර්ධනයන් පෝෂනය කර ඇත්තේ, එක්සත් ජනපද බැංකු හා අන්තර්ජාතික සංගතවල අවශ්‍යතා වෙනුවෙන් ලෝක ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීමේ කාර්යය සඳහා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ සුපිරි මිලිටරි ශක්තිය අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමේ මූලෝපායික පොදු එකඟතාවයකි. මෙහි අර්ථය නම්, පර්සියානු බොක්කේ දී මෙන් ම මූලෝපායික මධ්‍යස්ථාන හා සම්පත් අල්ලා ගැනීමත් ලෝක ආධිපත්‍ය සඳහා වන ඇමරිකානු ඔට්ටු තැබීමට අභියෝග කරනු ඇති කලාපීය ස්වරූපයේ විරුද්ධවාදියෙකු පවා ඉස්මතු වීම වලක්වනු පිනිස මිලිටරිවාදය හා යුද්ධය භාවිතා කිරීම ය.

න්‍යෂ්ටික අවි යොදා ගැනීම පිලිබඳ ප්‍රකාශිත සැලසුම් බුෂ් විසින් ඉවත දැමීම තිබිය දී ම, ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය තුල වරක් සිතන්නට පවා නොහැකි වූ දෙය දැන් ඉටු කර ගත හැකි විකල්පය ලෙස දකින බවට ඇති තරම් සාක්ෂ්‍ය තිබේ. ඇමරිකානු විදේශ පිලිවෙත් සංස්ථාපිතයේ දෘෂ්ටිය පිලිබිඹු කරන *ෆොරින් එෆෙයාර්ස් සඟරාවේ* අලුත් කලාපයේ පලවූ ලිපියක ශීර්ෂය වූයේ, "එක්සත් ජනපද න්‍යෂ්ටික ප්‍රමුඛතාවේ නැගී ඒම" ය. මෙම ලිපිය එක්සත් ජනපද අවි පද්ධතීන්හි තාක්ෂනික දියුනුව හා පෙර සෝවියට් සංගමයේ න්‍යෂ්ටික අවි ගබඩාවල පිරිහී යාම මත පදනම්ව ජයගත හැකි න්‍යෂ්ටික යුද්ධයක් වෙනුවෙන් කරුනු කියා සිටී.

"අද, අවුරුදු 50 කට පසුව, ප්‍රථමවතාවට එක්සත් ජනපදය න්‍යෂ්ටික ප්‍රමුඛතාවය අත් පත් කර ගැනීමේ අද්දරට පැමින සිටී", යයි එම ලිපිය පවසයි. " රුසියාවේ හෝ චීනයේ දුර විහිදුම් න්‍යෂ්ටික අවි ගබඩා ප්‍රථම ප්‍රහාරයෙන් ම විනාශ කර දැමීමට, එක්සත් ජනපදයට ඉක්මනින්ම හැකියාව ලැබෙනු ඇත."

රුසියාවට යාබදව පිහිටි ඉරානයට එරෙහි න්‍යෂ්ටික ප්‍රහාරයක් මෙම මූලෝපාය පරීක්ෂාවට ලක් කිරීමේ ප්‍රථම පියවර වනු ඇත. එය ඉටු කරනු ඇත්තේ හුදෙක් ඉරානය විනාශ වීම සහ එරට ඉමහත් මනුෂ්‍ය ඝාතනයත් පමනක් නොව, රුසියාවට, චීනයට සහ ඇමරිකානු අධිරාජ්‍යවාදී එල්ලයන්ට මග හරස් කරන අන් ඕනෑම බලවතෙකුට තර්ජනය කිරීම ය.

එක්සත් ජනපදය කෝටි ගනන් ජීවිත බිලිගන්නා වඩාත් පලල් සහ විනාශකාරී යුද්ධයක් දෙසට නිර්දය ලෙස යොමුවන දිශාවකට ගමන් කරමින් සිටියි. එක්සත් ජනපද මිලිටරි ආක්‍රමනයේ මීලඟ ක්‍රියාව සම්බන්ධයෙන් ප්‍රශ්නය වනුයේ එසේ වෙයිද යන්න නොව එසේ වන්නේ කවදාද යන්න ය.

පවතින එක්සත් ජනපද දේශපාලන ව්‍යුහය තුල මෙම තර්ජනය වැලැක්වීමේ ක්‍රමයක් නැති බව ඉරාකය දැනටමත් ඔප්පු කර තිබේ. ඉරානයට එරෙහි යුද්ධයක තර්ජනය පිලිබඳව ඩිමොක්‍රැටික් පක්ෂය මුනිවත රකියි. *නිව් යෝකර්* හි සිය ලිපිය තුල හර්ෂ්, නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ එක් සභිකයෙකු මෙසේ පවසනු උපුටා දක්වයි, නව යුද්ධයක් දියත් කිරීමට විරුද්ධව "කොන්ග්‍රසයෙන් පීඩනයක් නැත."

ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වයේ කිසිදු කොටසක්, න්‍යෂ්ටික අවි පවා යොදාගත හැකි යයි වාර්තාවූ යුද්ධයක දේශපාලන, මිලිටරි, නීතිමය සහ සදාචාරමය බලපෑම් පිලිබඳව සලකා බැලීමට ප්‍රසිද්ධ විභාගයක් පවත්වන ලෙසට කිසිදු කැඳවීමක් කර නැත. මෙම

නව සාපරාධී ක්‍රියාවේදී ද, ඉරාක ආක්‍රමනයේ දී හා යටත් කිරීමේදී කලා සේම, කොංග්‍රසය හා ඩිමොක්‍රැටිකයන් එකඟතාවය පල නොකරනු ඇතැයි සිතීමට කිසිදු හේතුවක් නැත.

"ඉරානය පිලිබඳව මිලිටරි සිහිනය" යන තෘප්තිමත් ශීර්ෂ පාඨය සහිතව *නිව් යෝක් ටයිම්ස්* පත්‍රයේ අඟහරුවාදා පලවූ කතුවැකිය පැරනි ලිබරලුන්ගේ ප්‍රතික්‍රියාවේ ලක්ෂන පෙන්නුම් කරයි.

"ඉරාක ආක්‍රමනයට පෙර විටින් විට කල ප්‍රකාශ සිහියට නංවන භාෂාවකින් අනාගත ඇමරිකානු මිලිටරි ක්‍රියා" පිලිබඳව පරිපාලනය තර්ජනය කරන බව සඳහන් කරමින් *ටයිම්ස්* පත්‍රය "කොංග්‍රසය හා මහජනතාව ඉරාකයට එරෙහි ඇමරිකානු ආක්‍රමනයට, පෙරාතුව, සැබවින් ම කිසි විටෙක සිදු නොවූ බැරෑරුම් ජාතික විවාදයක් වැනි දෙයක් සඳහා බල කිරීම අවශ්‍යය", යනුවෙන් ප්‍රකාශ කලේ ය.

නව ආක්‍රමනකාරී යුද්ධයක් පිලිබඳව "බැරෑරුම් ජාතික විවාදය" ක් සඳහා කතුවැකියේ කැඳවුම තුල හරියට ම ඉරාක ආක්‍රමනයට පෙර මාසවල දී *ටයිම්ස්* පත්‍රය භාවිතා කරන ලද භාෂාව දෝංකාර දේ. එකල ඔවුහු යුද්ධය සඳහා ව්‍යාජ - නීතිමය යුක්තිකරනයන් දිගට ම ගෙනයායුතු බවට පරිපාලනයට අවධාරනය කල අතර මහ ජනයා එයට සූදානම් කිරීමට "විවාදයක්" පැවැත්වීම වෙනුවෙන් හඬ නැගූහ. කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ අනුමැතියකින් තොරව ම ධවල මන්දිරය ආක්‍රමනයට අන දුන්විට පුවත්පත කොහොම නමුත් එයට සහාය දුන්නේ ය.

මැත ම කතුවැකිය ඉරානයට එරෙහි ගුවන් ප්‍රහාරවලින් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල පිලිබඳව ඉරාකයේ එක්සත් ජනපද හමුදාවන් වෙත අනතුරු අඟවයි. එවැනි ප්‍රහාරවලට ඇත්තටම "සියලු ඉරාන න්‍යෂ්ටික සැලසුම් විනාශ කිරීම" කල හැකි දැයි ප්‍රශ්න කරයි. ඉරානය සමග යුද්ධයක් "අපරීක්ෂාකාරී මුග්ධකමක්" සේ විස්තර කරයි. එහෙත් පුවත්පත, ප්‍රකෝප නොකල ගුවන් ප්‍රහාර හා සිදු විය හැකි න්‍යෂ්ටික අවි යොදා ගැනීමේ ඉඩ ප්‍රස්ථාවන් - යුද අපරාධ ලෙස හෙලා නොදකී. පැහැදිලිවම කතුවරු එවැනි දේ ඇත්තටම සිදුවිය හැකි දේ ලෙස සලකයි.

## රට තුල පොලිස් රාජ්‍යයේ පියවරයන්

ඇමරිකානු සමාජයට ම එවන් යුද ව්‍යායාමයක ඇඟැවුම් කම්පා කරවන සුලු ය. එවැනි ප්‍රහාර නිසැකවම පලිගැනීමේ ප්‍රහාරයන් උසිගන්වනු ඇති අතර, වොෂින්ටන් පරිපාලනය විසින් ඒවා, විදේශයන්හි තවතවත් යුද ව්‍යායාමයන්ට ද, රට තුල මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මුලිනුපුටා දැමීමේ ද රූපයෙන් " ත්‍රස්තයට එරෙහි යුද්ධය" නාටකාකාරව තීව්‍ර කිරීමට ද යොදා ගන්නවා ඇත.

ඇමරිකාව විසින් න්‍යෂ්ටික අවි භාවිතා කිරීම, ඇමරිකානු ජනතාව තුල විරුද්ධතාවයන් අවුලුවමින් කෝපය හා භීතිය ඇති කරනු ඇත. ආන්ඩුව සම්පූර්න මර්දනයකින් ප්‍රතිචාර දක්වනු ඇත. එවන් මිලිටරි ක්‍රියාවක අතුරු පලයක් ලෙස ඇමරිකානු ජනතාව ෆැසිස්ට්-මිලිටරි ඒකාධිපතිත්වයකට මුහුන දීමේ ප්‍රතිඵලය ඉතාම යථා රූපී ය.

ඉරානයට එරෙහි නව යුද තර්ජනය තුල පිහිටා ඇත්තේ වර්තමාන ඓතිහාසික යුගයේ මූලික විකල්පයන් යඃ එනම් සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද යන්න යි. මෙම නව තර්ජනයටත් ඉරාකයේ කෙරීගෙන යන යුද්ධයටත් එරෙහිව සටන් කල හැක්කේ ලොව පුරාම කම්කරුවන් හා පීඩිත ජනයා හා සමග එක්ව ඇමරිකානු කම්කරු ජනතාව ස්වාධීනව මෙහෙයවීම හරහා පමනකි. මෙය ඇමරිකානු මූල්‍ය කතිපයාධිකාරයට හා එහි දේශපාලනය පක්ෂ දෙකට එරෙහි දේශපාලන අරගලයක රූපය අත් කර ගනී.

අන්තරාය වනුයේ, ධනවාදයේ අර්බුදය හා එහි ප්‍රතිඵලය ලෙස මිලිටරිවාදයට හා යුද්ධයට යලි ගමන් කිරීම වේගයෙන් වර්ධනය වන අතර ඒවාට විරුද්ධවීමේ දේශපාලන මාර්ග බොහෝ පිටුපසින් ගැටීම ය. මෙම අන්තරාය, පැන නැගී තිබෙන ගැටලුවල බරපතලකම සහ ධනේශ්වර ද්වි පක්ෂ ක්‍රමය තුල කිසිදු දේශපාලන විකල්පයක් නැතිවීම අතර පරස්පරය දැනුවත්ව හඳුනා ගැනීම හරහා ජය ගැනීමට සිදු වී තිබේ.

අධිරාජ්‍යවාදය රඳා පවත්නා යල්පිනූ ජාතික රාජ්‍ය පද්ධතියට එරෙහිව සමාජවාදය සඳහා අරගලයේ දී කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුකම මත තමන්ම පදනම් වී ගන්නා නව ජනතා විප්ලවවාදී ව්‍යාපාරයක් පෙරට පැමිනිය යුතු ය. සමාජවාදී සමානතා පක්ෂය සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය එවන් ව්‍යාපාරක් පැන නැගීම සඳහා අවශ්‍යවන දේශපාලන පදනම දැමීම සඳහා සටන් කරමින් සිටියි.

© www.wsws.org